# ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## මහනුවර - කොළඹ මාර්ගයේ සුඛෝපභෝගී බස්රථ සඳහා ඇති වන අධික මගී ඉල්ලුම සපුරාලීම සඳහා අතිරේක බස්රථ සංචිතයක් ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය (2026.03.26 දක්වා)

**(බස්රථ හිමිකරු විසින් සම්පූර්ණ කළ යුතුය)**

01. හිමිකරුගේ/ආයතනයේ නම : ........................................................................................................

02. දුරකථන අංකය:....................................... WhatsApp අංකය :................................................

04. බස්රථ අංකය : .......................................

05. බස්රථයේ ආසන ධාරිතාවය: .......................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

| | |
|---|---|
| ...................................... | ...................................... |
| දිනය | බස්රථ හිමියාගේ අත්සන |

**කොන්දේසි**

1) සති අන්ත/දීර්ඝ සති අන්ත/විශේෂ උත්සව කාල වලදී පමණක් මෙම සේවාව ක්‍රියාත්මක කරන කොළඹ-මහනුවර දුම්රිය සේවාව යථාවත් වන තෙක් පමණක් මෙම විශේෂ බස් සේවාව ක්‍රියාත්මක කරනු ලැබේ.

2) බස් රථයේ ගමන්මාර්ගය වන්නේ කොළඹ සිට මීරිගම - කුරුණෑගල අධිවේගී මාර්ගය හරහා මහනුවර දක්වා වේ.

3) මගී සේවා අවසරපත්‍රයක් නොමැති ඉල්ලුම්කරුවන්ගේ සෑම මසකට වරක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අනුමත ගරාජයකින් ලබාගත් බස්රථයේ මූලික කාර්මික තත්ත්වය සම්බන්ධ තත්ත්ව වාර්තාවක් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය.

4) මගී සේවා අවසරපත්‍රයක් නොමැති ඉල්ලුම්කරුවන්ගේ බස්රථයට පූර්ණ රක්ෂණාවරණයක් තිබිය යුතු අතර එහි ගමන් ගන්නා මගීන් සඳහා අසීමිත රක්ෂණ ආවරණය ලබා තිබීම අනිවාර්ය වේ.

5) මෙම බස්රථ වල ආසනගත මගීන් පමණක් ප්‍රවාහනය කළ යුතුය.

6) මෙම බස් රථ සඳහා නිකුත් කරනු ලබන තාවකාලික අවසරපත්‍රය එහි සඳහන් කාල සීමාවට පමණක් වලංගු වේ.

7) මෙම බස් රථය මහනුවර-කොළඹ සේවාවෙහි ධාවනය වන සෑම අවස්ථාවකම තාවකාලික අවසරපත්‍රය බස් රථය තුළ තිබිය යුතුය.

8) සති අන්ත සහ දීර්ඝ සති අන්ත වලදී පමණක් මෙම බස්රථ ක්‍රියාත්මක වන බැවින්, අධිවේගී මාර්ගය හරහා ධාවනය වන බැවින් සහ එක් අන්තයකට මගීන් නොමැතිව ධාවනය වීමට සිදුවීම යන කරුණු සලකා බලා මෙම බස්රථ සඳහා බස්රථයේ ආසන ප්‍රමාණයෙන් 25%ක ප්‍රමාණයකට ගමන් ගාස්තුව ප්‍රතිපූර්ණය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන අතර අනුමත ගමන් දිශාව හැර ආපසු ගමනේදී මගීන් නංවා ගැනීම නොකළ යුතුය.

9) බස් රථයේ සේවයේ යොදවා ඇති රියදුරු, කොන්දොස්තර මහතුන් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ලියාපදිංචි වූ අය විය යුතු අතර, මූලික ලියාපදිංචිය සඳහා එය බාධාවක් නොවන අතර, ධාවනයේදී එය සපුරාලිය යුතුය.

10) ධාවනයේ යෙදෙන දිනය හා වේලාව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබනු ඇත.

11) බස්රථයේ අවම ආසන ගණන 45ක් විය යුතුය

12) බස්රථයේ පිරිවිතර ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අනුමත කළ යුතුය.

13) මෙම තාවකාලික අවසරපත්‍රය පදනම්ව නිත්‍ය මගී සේවා අවසරපත්‍රයක් ඉල්ලුම් කිරිමට කිසිදු අයිතිවාසිකමක් හිමි නොවේ.

14) කොමිෂන් සභාව මඟින් නියම කරනු ලබන ගාස්තු පමණක් මගීන්ගෙන් අය කල යුතු අතර, එම වටිනාකමට අදාල ප්‍රවේශ පත්‍රයක් නිකුත් කළ යුතු වේ. එම ප්‍රවේශ පත්‍රය ජාතික ගමනාගමන කොමිෂන් සභාව අනුමත ආකෘතියට අනුකූල විය යුතුය.

15) ඉහත කොන්දේසි වලට යටත්ව තාවකාලික අවසරපත්‍ර නිකුත් කිරීම හෝ නොකිරිම සම්බන්ධ සියලු තීරණ ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතු වේ.

ඉහත කොන්දේසි ප්‍රකාරව තාවකාලික අවසර පත්‍රයක් යටතේ මාගේ බස්රථය ලියාපදිංචි කරගන්නා ලෙස ඉල්ලා සිටින අතර, ස්ථිර මගී සේවා අවසර පත්‍රයක් ලබා ගැනීමට මෙය සුදුසු කමක් නොවන බව මා හොඳින් දන්නා බව ප්‍රකාශ කරමි.

.....................................

දිනය

.....................................

බස්රථ හිමියාගේ අත්සන